වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 10 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 පෙබරවාරි 29 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 24 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
---------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2009 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබුණු පික්කප් මෝටර් වාහනය සහ ට්‍රැක්ටර් රථයේ අයිතිය පවරා ගෙන වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙනවිත් නොතිබීමෙන් මෝටර් වාහන සහ කරත්ත වටිනාකම් ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ වටිනාකම් තක්සේරුකර ගිණුම්වලට ගෙනවිත් නොතිබීමෙන් ගොඩනැගිල්ලේ වටිනාකම ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 ලේඛන හා පොත්පත් නොපැවැත්වීම
------------------------------------------------

සභාව විසින් මැණුම් ලේඛනය, ඉඩම් විකුණුම් බදු ලේඛනය යනාදී ලේඛන පවත්වා නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම
------------------------------------

විශ්‍රාමිකයන්ගේ සනාථකරන ලද ලැයිස්තු, ප්‍රතිලාභින්ගේ සනාථ කිරීම් සහ මිල ගණන් නොමැති වීම නිසා රු. 481,367 ක් වටිනා ගෙවීම් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලන රීති පරිච්ඡේදයේ III රීති 32 | සභාව විසින් වරිපනම්බදු තක්සේරු සම්බන්ධයෙන් තක්සේරු ලේඛන පවත්වා නොතිබුණු අතර වරිපනම් අයකිරීම් සභාව විසින් සිදුකර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මුදල් රෙගුලාසි 103 | රු. 21,965 ක් වටිනා වතුර මෝටරය සොරකම් කිරීම පිළිබඳව වගකිව යුතු අය හඳුනාගෙන පාඩුව අයකර ගෙන නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 316(2) | සුරක්ෂිත භාරයේ තබා ඇති ද්‍රව්‍ය පිළිබඳ වාර්තා පවත්වා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵලය

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 67,689,361 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 45,356,298 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂය අවසන් මූල්‍ය ප්‍රතිඵලය රු. 22,333,063 කින් වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය ශුද්ධ අතිරික්ත රු 3,891 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 4,857 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අවසාන මූල්‍ය ප්‍රතිඵලය රු. 966 කින් පහත වැටීමක් පෙන්නුම් කෙරිණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

---

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 262,639,035 ක්වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 114,442,725 ක් වී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 148,196,310 කින් වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

ලේකම් විසින් ඉදිරිපත් කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2016 | | |
|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 600 | 626 | 5,246 |
| බදු කුලී | 14,061 | 15,476 | 375 |
| බලපත්‍ර ගාස්තු | 1,808 | 2,070 | - |
| වෙනත් ආදායම් | 106,448 | 103,697 | 191,327 |
| එකතුව | 122,917 | 121,869 | 196,948 |

2.4.2 වරිපනම් බදු

සභා බලප්‍රදේශයේ තිබෙන දේපළ සඳහා වර්ෂ 05 කට වරක් තක්සේරු කර නොතිබුණි.

2.4.3 බදු කුලි

2012 වර්ෂයේ සිට හිඟව තිබූ මස් කඩ හිඟ බදු මුදල සහ දඩ මුදල රු. 26,892 ක් වාර්තා දිනය දක්වා අයකර නොතිබුණි.

2.4.4 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු

(අ) රු. 2,029,348 ක උසාවි දඩ මුදල් අද දක්වා සභාව විසින් අයකර ගෙන නොතිබුණි.

(ආ) රු. 136,236,619 ක මුද්දර ගාස්තු, ඉඩම් රෙජිස්ටාර් ජනරාල්වරයාගෙන් අයකර ගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 123 ක් වුවද තත්‍ය සේවක සංඛ්‍යාව 94 කි. ඒ අනුව සේවක පුරප්පාඩු 30 ක් සහ අතිරික්තය 01 ක් විය.

3.2 ප්‍රමාදවූ ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී රු. 30,736,363 ක් වටිනා ප්‍රාග්ධන වැඩ, සභාව විසින් ආරම්භකර නොතිබුණි.

3.3 අපද්‍රව්‍ය කළමනාකරණ

---------------------------

අපද්‍රව්‍ය වර්ගීකරණය කිරීමෙන් තොරව ගොඩ ගසා තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------

අයවැය පාලනය

-----------------

වියදම් ව්‍යුහය

---------------

අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 2,517 සිට රු. 10,708,222 දක්වා වියදම් විචලනයක් විගණනයේදී නිරීක්ෂණය විය.